**මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය**

# වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය අමතර අරමුදල් සැපයීම (DSWRPP-AF)

**අරමුදල් සැපයීම (IDA) ලෝක බැංකුව**

**(ණය අරමුදල් අංක – 4406 - CE)**

# ඇබෑර්තු

## සන්නිවේදන / මාධ්‍ය නිලධාරී

ශ්‍රී ලංකා රජය විසින්, වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතියෙහි (DSWRPP) – AF පිරිවැය සඳහා, ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) වෙතින් මූල්‍ය සම්පාදනයක් ලබා ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මකය.

වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි පවත්නා සන්නිවේදන / මාධ්‍ය නිලධාරී තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් මෙයින් අයදුම්පත් කැඳවනු ලබන අතර, මෙම පත්වීම, කොන්ත්‍රාත් පදනමින් එක් වසරක් සඳහා වන අතර, කාර්යසාධනය මත හා ව්‍යාපෘතියේ අවශ්‍යතාවය මත අලුත් කිරීමේ අවස්ථාව ඇත.

**සන්නිවේදන / මාධ්‍ය නිලධාරී - PS 5 - (තනතුරු 01)**

**රාජකාරී හා වගකීම්**

- ව්‍යාපෘතියට අදාලව වීඩියෝ වාර්තා චිත්‍රපටි සැලසුම් කිරීම.
- අවශ්‍ය වීඩියෝ හා ඡායාරූප ගැනීම.
- DSWRPP සඟරාව සංවර්ධනය කිරීම.
- සමාජ හා පාරිසරික ක්‍රියාකාරකම්වලට අදාලව ප්‍රචාරක විස්තර පත්‍රිකා සකස් කිරීම.
- ව්‍යාපෘතියට අදාලව ප්‍රවෘත්ති පත්‍ර ලිපි රචනා කිරීම.
- ව්‍යාපෘතියෙහි ලබාගත් ජයග්‍රහණ මහජනතාව වෙත ගෙනයාම සඳහා මාධ්‍ය සබඳතා සම්බන්ධීකරණය කිරීම.
- ව්‍යාපෘතියෙහි සියලුම ප්‍රවෘත්තිමය වැදගත්කමක් ඇති ප්‍රකාශන සැලසුම් කිරීම.
- ව්‍යාපෘතිය තුළ හා ඉන් පිටත තොරතුරු හුවමාරු කිරීම පිණිස ව්‍යාපෘතිය සඳහා සුදුසු සන්නිවේදන උපායමාර්ග මූලාරම්භ කොට, සැලසුම් කොට සංවර්ධනය කිරීම.
- ව්‍යාපෘතියෙහි වෙබ් අඩවිය යාවත්කාලීන කොට සියලු වෙබ් ආශ්‍රිත සන්නිවේදන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන හා උපදේශකයින් සමඟ තොරතුරු බෙදාහදා ගැනීම.

**අවශ්‍ය සුදුසුකම්**

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්,

සහ

- අවශ්‍ය විශේෂඥතා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04 ක පළපුරුද්ද.
- ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීමේ හැකියාව.

**පොදු කොන්දේසි :**

**(1) වයස :**

අයදුම්කරුවන් අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 65 ට නොවැඩි විය යුතුය.

**(2) වැටුප් පරිමාණය :**

අංක 01/2016 දරන කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව රජය විසින් අනුමත වැටුප හිමිය.

**(3) අයදුම්පත් ඉදිරිපත් කිරීම :**

අධ්‍යාපන, පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය ලේඛනවල පිටපත් සහිතව අයදුම්පතක්, **ව්‍යාපෘති අධ්‍යක්ෂක, වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය – AF, 01 වන මහල, අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10** යන ලිපිනයට, ලියාපදිංචි තැපැලෙන්, **2016 ඔක්තෝබර් 14** වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

රාජ්‍යයේ සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩලවල / සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු අතර, ඔහු විසින්, අදාළ අයදුම්කරු, මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදා හැරිය හැකිද, යන්න සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂක,**
**වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය - AF,**
**01 වන මහල, MASL ගොඩනැගිල්ල,**
**අංක 500, ටී.බී. ජයා මාවත,**
**කොළඹ 10.**